**SMART VISUAL ENTERPRISES**
*Research and development*
No. 146, Millaniya Estate, 3rd Stage, Paragastota.
Hotline : 0722-273877 Office : 0345717417
E-mail : ssmartvisual@gmail.com

# විදුලි / විද්‍යුත් භාණ්ඩ ආරක්ෂණය

ඔබගේ වටිනා විදුලි හා විද්‍යුත් භාණ්ඩ විශේෂ ආරක්ෂක පරිපථ වලින් (Power Guard) ආරක්ෂා කර ගතයුතු වන්නේ විදුලිබල සැපයුමෙහි නියමිත වෝල්ටීයතාවය අවම හා උපරිම ප්‍රමාණයන් වෙනස්වීම හා විදුලි සැපයුම හදිසියේ විසන්ධිවීමෙන් ක්ෂණිකව නැවත නැවත සම්බන්ධවීම, වැසි දිනවලදී සිදුවන විදුලි කෙටීම හා අකුණු සැර නිසාද අනාරක්ෂිත වන බැවිනි. එසේම මෙම ස්වාභාවික අනතුරු සඳහා විදුලි / විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදකයා වග කියනු නොලබයි. එවැනි අවස්ථාවලදී කාලය මහන්සියද, ශ්‍රමයද, ධනයද අමතරව වැය කළයුතු අතර කණගාටුවට හේතුවන කරුණ වන්නේ දැනට නිපදවන සියළු විදුලි හා විද්‍යුත් උපකරණ තුල ආරක්ෂක පරිපථ නොමැතිව නිපදවීම හා ගුණාත්මක භාවයද ඉතාමත් මඳ බැවින් පාරිභෝගික ඔබ තවත් අසරණවීමයි.

## නිෂ්පාදිත අත්දැකීම්

මෙම භාණ්ඩ නිෂ්පාදනය කරනුයේ ඉලෙක්ට්‍රොනික් ක්ෂේත්‍රයේ වසර 20 කට නොඅඩු කාලයක් රැඳී සිටින හා ලංකාවේ උපකරණ අලෙවියේ හා නිෂ්පාදනයේ ප්‍රමුඛ සමාගමක වසර 12 ක අත්දැකීම්ලත් හා Power Guard නිර්මාණයේ අද්විතීය සොයාගැනීම් සඳහා පේටන්ට් බලපත්‍ර සහිතවද, නිවෙස් හොරුන්ගෙන් ආරක්ෂක පරිපථ නිෂ්පාදනය සඳහා විද්‍යාතා සහතික ලත් රූපවාහිනී තාක්ෂණ ආයතනයේ (ITVT) ඩිප්ලෝමාවද, නව නිපැයුම් හිමියන්ගේ කොමිසම මගින් පවත්වන ලද ජනාධිපති සම්මාන තරඟයේදී ඉංජිනේරු අංශයෙන් ස්වර්ණ සම්මාන (Presidential award Best Winning - 2011) කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් පවත්වන ලද SMIDEX National Award - **2014** (නව නිපැයුම් අංශය) පර්යේෂණ හා තාක්ෂණ අමාත්‍යාංශයේ Sahasak Nimavum National Award - **2014** හිමිකර ගත් තාක්ෂණ ආයතනයක් විසිනි.

## වගකීම්

මෙම භාණ්ඩ ඔබ විසින් මැදිහත් වීමක් නොකර තිබෙනතාක් කල් එහි ක්‍රියාකාරිත්වය අවුරුද්දක කාලයක් සඳහා සහතික කෙරේ. ප්‍රබල අකුණු වලින් වන හානි සඳහා වගකීමක් දිය නොහැක. ස්වාභාවධර්මයෙන් සිදුවන අකුණු ගැසීම්, ජල ගැලීම් වලින් වන හානි වැලැක්වීමට ජගතෙකු හෝ උපකරණයක් හෝ නොමැත. මෙම Power Guard වලින් කළහැක්කේ අකුණුසැර කෙලින්ම ඔබගේ විදුලි උපකරණ වෙතට යෑමෙන් සිදුවනහානි වලක්වා ගැනීමයි.

## පාරිභෝගිකයාට ලැබෙන වාසි

අපගේම තාක්ෂණයෙන් දේශීය නිෂ්පාදනය කර ඇති මෙම Power Guard යක් ඔබ නිවසේ ඇති විදුලි / විද්‍යුත් උපකරණයකට සම්බන්ධ කළ පසු ඔබ නිවසින් බැහැරව ගොස් සිටියත්, නිවසේ නිදා සිටියත් එම උපකරණවල ආරක්ෂාව තහවුරු කෙරේ. එමගින් ඔබේ සිතට ඉමහත් සහනයක් ලබාදෙනු ඇත. මේ සඳහා වගකීමේ සහතිකයක් දෙනු ලැබේ. ඉන්පසු වුවද අපගේ සුහදශීලී සේවය අවශ්‍ය නම් ලබාගත හැක.

# ශීතකරණ සඳහා




* උපරිම ධාරිතාවය - 1000W

* වැඩි විදුලියෙන් අපගේ විදුලි උපකරණ ආරක්ෂා කර ගත යුතු අවම වෝල්ටීයතාවය 260 V පරිපථයෙන් සකස් කර එම ප්‍රමාණයට වඩා වැඩි වුවහොත් ස්වයංක්‍රීයව විසන්ධි වේ.

* අඩු විදුලියෙන් අපගේ විදුලි උපකරණ ආරක්ෂා කර ගත යුතු අවම වෝල්ටීයතාවය 180V පරිපථයෙන් සකස් කර එම ප්‍රමාණයට වඩා අඩු වුවහොත් ස්වයංක්‍රීයව විසන්ධි වේ.

* පරිපථයට විදුලිය ලැබී ක්‍රියාත්මක කාලය වි. 5 කි.

* විදුලි සැපයුම දිගේ එන අකුණු සැර විදුලිය කපා හරින නැවත සම්බන්ධ කරගත හැකි පිටතින් සවිකර ඇති ආරක්ෂණ ෆියුසය මගින් අකුණු ආරක්ෂාව සැලසේ.

* 5A - 13A ද්විත්ව Outlet Socket 1 කි.

Model No: SVE 1215

# TV, Home Theater, Computer ආදී සියළු විද්‍යුත් උපකරණ සඳහා




* උපරිම ධාරිතාවය - 1000W

* වැඩි විදුලියෙන් අපගේ විදුලි උපකරණ ආරක්ෂා කර ගත යුතු අවම වෝල්ටීයතාවය 260V පරිපථයෙන් සකස් කර එම ප්‍රමාණයට වඩා වැඩි වුවහොත් ස්වයංක්‍රීයව විසන්ධි වේ.

* අඩු විදුලියෙන් අපගේ විදුලි උපකරණ ආරක්ෂා කර ගත යුතු අවම වෝල්ටීයතාවය 180V පරිපථයෙන් සකස් කර එම ප්‍රමාණයට වඩා අඩු වුවහොත් ස්වයංක්‍රීයව විසන්ධි වේ.

* පරිපථයට විදුලිය ලැබී ක්‍රියාත්මක කාලය ත. 15 කි.

* විදුලි සැපයුම දිගේ එන අකුණු සැර විදුලිය කපා හරින නැවත සම්බන්ධ කරගත හැකි පිටතින් සවිකර ඇති ආරක්ෂණ ෆියුසය මගින් අකුණු ආරක්ෂාව සැලසේ.

* 5A - 13A ද්විත්ව Outlet Socket 1 කි.

Model No: SVE 1314

AWARD WINNING INVENTOR
PRESIDENTIAL AWARD
BEST INVENTION IN ENGINEERING 2011

## ඔබගේ නිවසේ විදුලි පද්ධතිය අනාරක්ෂිතද?

Web : www.slic.gov.lk




Model No. SVE 1017
Patent No. 15341

මෙම පරිපථයේ ඇති සුවිශේෂී හැකියාව වනුයේ නිවසේ හෝ ආයතනයක විදුලිබල සැපයුමේ පවතින්නාවූ ප්‍රමිතිය නිරීක්ෂණය කර ආරක්ෂාව සැලසීමයි.

## 5 IN ONE

* අඩු විදුලි ආරක්ෂාව (LOW VOLTAGE PROTECTION)
* වැඩි විදුලි ආරක්ෂාව (HIGH VOLTAGE PROTECTION)
* භූගත අග්‍රයේ සම්බන්ධතාවය (EARTH DETECTION)
* LIVE හා NEUTRAL අග්‍රය නිවැරදි දැයි පරීක්ෂාව (LIVE & NEUTRAL SEQUENCE)
* TRIP SWITCH ය නිසි ක්‍රියාකාරීත්වයෙන් ද යන වග (QUICK ISOLATOR TEST)

අපගේ Auto Valtage Security System පරිපථය නිවසේ කුමන හෝ ප්ලග් බේසයකට සවිකර ගැනීමෙන් එකම පරිපථයෙන් මුළු නිවසටම වෝල්ටීයතා ආරක්ෂාව Trip Switch ය විසන්ධි කර සලසා දෙනු ලැබේ.

විදුලි සැපයුම දිගේ එන අකුණු සැර විදුලිය කපා හරින නැවත සම්බන්ධ කර ගතහැකි පිටතින් සවිකර ඇති ආරක්ෂණ ෆියුසය මගින් අකුණු ආරක්ෂාව සැලසේ. ත්‍රිකලා විදුලිය ලබා ඇත්නම් මෙම පරිපථ තුනක් සවිකර ගත යුතුවේ.

සවිකර ගැනීමට ඉතාමත් පහසුවේ